26 වන පිටෙන්

## හද රිදවන මතක සුවඳ

"මම පක්ෂයට හොඳක් මිසක් කවදාවත් වැරැද්දක් කරලා නෑ. වැරැද්දක් කරගත්තා නම් ඒ මටමයි. මොනවද ඔය සාක්ෂි ?"

තම දිනපොත තුළින් තවත් කොළයක් ගත් ශිරෝමන් එය තරමක් ඈතට කර මට පෙන්වුයේ මා එය උදුරා ගනීදෝ යන සැකයෙන් මෙනි.

මගේ ගත කිළිපොලා ගියේ ය. බියකින් නොව පිළිකුලෙනි. බඩ දැගලා ඕක්කාරයට ඒමට තරම් වු අප්‍රියාවකිනි. සැබවින්ම එය මගේ අත්අකුරින් මා ලියු ලිපියකි. අභයගුණ මිත්‍ර ද්‍රෝහියෙකු පමණක් නොව මේ ලෝකයේ සිටින අග්‍රගණ්‍ය මට්ටමේ නිහීනයෙක් බවද මට ප්‍රත්‍යක්ෂ වුයේ එම මොහොතේදී ය.

"ඔතන මගේ කිසි වැරැද්දක් නෑ. මම ඔය හැම දෙයක්ම කළේ මගේ මිත්‍රයාගෙන් පක්ෂයට යහපතක් වෙයි කියන පිරිසිදු සිතින්. චේතනාවෙන්. මිනිස්සු අවස්ථාවාදීයෝ උනාට මම මොනවා කරන්නද? ඔතන මට පේන එකම වැරැද්ද මම මගේ මිත්‍රයෙකුට ලියපු ලියුමක් ඔයා තියාගෙන ඉන්න එකයි. ඒක ලැජ්ජ නැති වැඩක්. ඔය ලියුම පෙන්නීමෙන් කවුරුහරි බලාපොරොත්තු වෙන්නේ මම භය ගන්නලා මගේ කට වැස්සවීම නම් ඒක හීනයක්."

මා එතැනින් නැගිට ආවේ ශිරෝමන් එහි සිටියදීම ය.

ඉන් දෙදිනකට පසු මා ඇමතු කැමිලෝ සහෝදරයා තමා ද පක්ෂයෙන් ඉවත් කළ පුවත මට දන්වා සිටියේ ය.

මා මෙම සටහන ලියන අවස්ථාවේ මේ සිදුවීම් සිදු වී වසර පහළොවකට ආසන්න කාලයක් ගතව ගොස් ඇත. සෝමවංශ අමරසිංහ සහෝදරයා වයසින්ද අත්දැකීම් වලින්ද අද එදාට වඩා පරිණත නායකයෙකි. ඔහු මෙන්ම අපි ද වයසට යමින් සිටිමු. ලන්ඩන් ශාඛාව විසුරුවා හැරීම ගැන අද ඔහු සිතන්නේ කුමක්දැයි මම නොදනිමි. එහෙත් ඔහුගේ හෘද සාක්ෂියේ විනිශ්චය ඔහු තුළ සියුම් පසුතැවිල්ලක් හෝ ඇතිකරනු ඇතැයි මම සිතමි.

අමරසිංහ සහෝදරයා ලන්ඩන් ශාඛාවේ උන් සහෝදරවරුන්ට ඉදිරිපත් කරන ලද චෝදනා කොතරම් බොළඳ හාස්‍යජනක ඒවාදැයි ඉතිහාසයේ විනිශ්චය විසින් වඩා හොඳින් පසක් කරන්නේ අදය. "රෝහණ විජේවීර සහෝදරයා ප්‍රමුඛ නායකයන්ගේ සාමාජිකයන්ගේ ඝාතන ගැන ජාත්‍යන්තර අධිකරණයට නොයාම" හිටපු ලන්ඩන් සොයුරන්ට ඔහු ඉදිරිපත් කළ බරපතළ චෝදනාවකි.

එසේ නම් ලන්ඩන් ශාඛාවේ සාමාජිකයන් නොකළ එම කටයුත්ත වසර ගණනක් ඉතාලියේ සහ ප්‍රංශයේ සිටි,

***<u>ජ.වි.පෙ. මා දකින ලොකුම දුර්වලකම තමයි, 'දිය කොරහෙත් කිඹුලන් දැකීම' හෙවත් පුද්ගලයන් අස්ථානයේ සැකයට භාජන කිරීම.</u>***

එසේ සිටිමින් ලන්ඩනයට ද අනෙක් රටවලට ද ගිය සෝමවංශ අමරසිංහ සහෝදරයා නොකළේ මන්දැයි යන්න සාධාරණ හා ප්‍රබල ප්‍රශ්න කිරීමකි. එයට ඔහු දෙන පිළිතුර කුමක්ද ? එවිට කල්ගත වී ඇති බවද ? එසේ නම් නාසි ජර්මනියේ හිට්ලර්ගේ යුධ අපරාධ හා යුදෙව් ඝාතන ගැන අද වුව ජාත්‍යන්තර අධිකරණයට යාමට ඇති හැකියාව ගැන කියන්නේ කුමක්ද ? ලන්ඩන් ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත් අපරිණත තීරණය නිසා පාඩුව සිදුවුයේ පක්ෂයට ද ? ඉවත් කරන ලද පුද්ගලයන්ට ද? ලන්ඩන් ශාඛාව විසුරුවා හැර පත්කළ නව ශාඛාවේ හෝ වර්තමාන ලන්ඩන් ශාඛාවේ තත්ත්වය තිබුණාට වඩා දියුණුද ? පරිණතද ? එය අටුව කඩා පුටුව හැදීමකට වඩා කිසිසේත්ම වෙනස් නැත. ලන්ඩන් ශාඛාවේ හිටපු සොයුරන් අද දක්වා සිටියේ නම් ඔවුන් දේශපාලන අතින් හා ජාත්‍යන්තර දේශපාලන කටයුතුවලින් ලබන ලද අත්දැකීම්වලින් කොතරම් පරිණතද ?

පැරිසියේ පක්ෂ ශාඛාවේ තත්ත්වය ද එසේම ය. පක්ෂයේ පත්තර විකුණන්නට විරෝධතා ව්‍යාපාරවලදී පිකට් බෝඩ් උසුලාගෙන සිටීමට, ආධාර එකතු කිරීමට කැපවුණ සහෝදරවරුන් පිරිසක් සිටින බව සැබෑය. එහෙත් යම්කිසි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගී වී හෝ විදේශීය මාධ්‍ය ආයතනයන් කරන සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වී ප්‍රංශ භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පක්ෂයේ ප්‍රතිපත්ති හා දේශපාලනය ගැන පැහැදිලි කර දීමට හැකි සමතකු පැරිස් ශාඛාවේ සිටීද? පැරීසියේ තත්ත්වය ගතහොත්, තමාගේ හැකියාවන් නිසා පක්ෂය බැබළවුවන්ට වඩා අද පක්ෂයට සමීපවෙමින් සිටින්නේ පක්ෂයෙන් බැබලීමට උත්සාහ කරන දේශපාලනය ගැන මෙලෝ හසරක් නොදන්නා අඥ බාලයන් ය. කැමිලෝ වැනි සහෝදරයෙකු අද දක්වා ගොඩනගා ගත්තා නම් එය පක්ෂයට සම්පතකි. කැමිලෝ නෙරපීමෙන් පාඩුවුයේ කැමිලෝටද ? පක්ෂයටද ?

කවුරුන් පිළිගන්නට අකමැති වුවද අද ජනතා විමුක්ති පෙරමුණ එදා ජනතා විමුක්ති පෙරමුණ නොවේ. පවත්නා තත්ත්වය එයට දවසින් දවස වෙනස්වීමට බල කරමින් සිටී. සරල උදාහරණයක් ගතහොත් 80 දශකයේදී රෝහණ විජේවීර සහෝදරයා අරලියගහ මන්දිරයට ගොස් තේ පැන් සංග්‍රහයක් විඳ පැමිණියේ නම් පක්ෂ සාමාජිකයන්ගේ ප්‍රතිචාරය කෙබඳු වේදැයි සිතතොත් අද අපගේ නායකයන් ජනාධිපති මන්දිරයට යාම පක්ෂ සාමාජිකයන් කලබල කරවන්නක්ද ? කොමියුනිස්ට් වාදයේ පදනම වු සාමුහික පොදු දේපළ ක්‍රමය තව දුරටත් යථාර්ථයක් නොවෙමින් තිබේ. දැන් ජ.වි. පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදයේ ජනප්‍රිය ක්‍රමයක් වන ජනතා ඡන්දයෙන් පාර්ලිමේන්තු නියෝජිතයන් වන ක්‍රමය පිළිගෙන ඇති බැවින් නුදුරු අනාගතයේදී 'සමාජ ප්‍රජාතන්ත්‍රවාදී' පක්ෂයක් බවට පරිවර්තනය වීමට බොහෝ දුරට ඉඩ තිබේ. පැරිසියේ වසර කිහිපයක් ජිවත් වු අමරසිංහ සහෝදරයාට ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂයට ඇති අඩු ජනතා සහයෝගයත්, ප්‍රංශයේ පාටි සෝෂලිස්ට් (ඡශී) පක්ෂයේ (ප්‍රංශුවා මිතරොං ජනාධිපතිවරයා නියෝජනය කළ පක්ෂය) ප්‍රතිපත්තිවල ඇති ජනතාවාදී බව හා මානුෂික ලක්ෂණත්, ජනතා සුබසාධන සේවාවන් ඉහළ මට්ටමක ඇති එම ක්‍රමයට ජනතාව දක්වන කැමැත්තත් ගැන අවබෝධයක් ඇතුවා නිසැකය.

අද ජ.වි පෙරමුණේ සිටින්නේ මුල් යුගයේදී මෙන් සිරුරේ ලේ දන්දී, බස්නැවතුම් පොළවල මුට්ට කරගසා, දින ගණන් කුසගින්නේ සිට, හැතැප්ම ගණන් පයින් ඇවිද ජනතාව දුන් දෙයකින් කුසගිනි නිවාගන්නා නායකයන් නොවේ. (අද පක්ෂය ලබා ඇති දියුණුව මත පෙරදී මෙන්ම ක්‍රියාකළ යුතුයැයි මින් අදහස් නොකෙරේ) දුෂ්කරතාවලින් මිදී තරමක් හෝ පහසු ආකාරයට ජිවත්වන පිරිසකි. එබැවින් ජනතාව හා ඔවුන් අතරවන බැඳීම පෙර තරම් ගැඹුරු ආත්මීය තත්ත්වයක නොපවතී යයි කීම සාහසික ප්‍රකාශයක් නොවේ.

ඔබ දැන් ජ.වි. පෙරමුණ ගැන දරන්නේ කවර ආකල්පයක් දැයි කිසිවෙකු මගෙන් විමසුවහොත් මට ඇත්තේ මෙවන් පිළිතුරකි.

"ලංකාවේ අන් සියලුම පක්ෂවලට සාපේක්ෂව ගත්කල හොඳම දේශපාලන පක්ෂය ජ.වි.පෙ. යි. මා එදත්, අදත්, හෙටත් ආදරය කරන එකම පක්ෂය එයයි. පක්ෂයට ආදරය කරන්න මා කාගෙන්වත් අවසර ගතයුතුත් නෑ. කවුරුවත් අවසර දියයුතුත් නෑ. ජ.වි.පෙ. මා දකින ලොකුම දුර්වලකම තමයි, 'දිය කොරහෙත් කිඹුලන් දැකීම' හෙවත් පුද්ගලයන් අස්ථානයේ සැකයට භාජන කිරීම. අවුරුදු 70 ක් සමාජවාදී පාලනයක් තිබුණ සෝවියට් රුසියාව බිඳ වැටුණේ එහි තිබුණ නිලධාරිවාදය නිසාවත්, ඇමරිකාව කරපු නොනවතින කුමන්ත්‍රණ නිසාමවත් නෙවි. ජනතාව අතර කොමියුනිස්ට්වාදයේ සතුරන් ඇතැයි සිතු රාජ්‍ය පාලකයෝ ජනතාව මත හෙළූ සැකයේ හා අවිශ්වාසයේ පීඩනය රටේ ජනතාවට තව දුරටත් විඳිය නොහැකි දරුණු මානසික වධයක් උන නිසා. අනාගත ලංකාවේ ජ.වි.පෙ. රාජ්‍ය බලයට පත්වෙයි කියන එක ගැන සැකයක් නැතිමුත් පක්ෂයේ ඉහළ සිට පහළටම පවතින මේ විනාශකාරී දෘෂ්ටිය හෙවත් ඉතාම නොවැදගත් හේතුමත පවා පක්ෂයේම මිනිසුන් ඉතා ලේසියෙන් පසෙකට විසිකර දැමීමේ දුර්වලතාවයත් හඳාගත යුතුයි. එහෙම නැත්තම් කොයිතරම් කැපකිරීම් පරිත්‍යාග කරලා, කොයිතරම් වෙහෙස මහන්සි වෙලා ගොඩ නගන රජයක් උනත් පවතින්නේ නෑ. ඒකට සෝවියට් රුසියාවත්, රුසියාවේ බලධාරීන්ගෙන් රෝහණ විජේවීර සහෝදරයාට සිද්ධ වුණ අසාධාරණයත් තරම් හොඳ උදාහරණයක් අපිට තියෙනවාද ?

නවතිමි.
ඒ සඳහා මම නවතිමි.
නැවතීමය ගමන.
(මහගම සේකර)

warna LEGAL
Justice for all...
FIRST CONSULTATION FREE
Family Law
Business Law & Commercial Law
Conveyancing
Migration Law
Powers of Attorney & Wills
Australian/Sri Lankan Legal Advises
Madhu Warnakulasuriya LL.B.
Barrister & Solicitor
29 Tristania Street, Doveton VIC 3177
Tel: 03 9713 1118 Fax: 03 9713 1118
Skype: warnalegal
Email: warnalegal@gmail.com
MARN: 1068979
Call 0432 480133



Looking for accommodation in Sri Lanka



Staying at Ethara residencies is similar to having your own little holiday home in the heart of Rajagiriya, Colombo. Tucked in amongst nature away from the busy City, you'll have peace, privacy and space. Ethara residency is found in our own three story house where you have the whole top floor to yourself. For US $75 per night you will have:

- A highly secure holiday home for families with children or a group of friends under the care of our resident manager.
- 3 large bedrooms - 4 to 5 people can sleep, two bathrooms with hot water, Tea/coffee making facility, veranda, large balcony with nice view and lots of natural air and light.
- Gas Stations, Banks, Post Office, Cargils and Keells super markets, KFC, Pizza Hut, McDonald's, Perera & Sons, Barista and many other restaurants within easy access.
- 2 TVs and a selection of English novels for your entertainment.

Please email dates of your stay to
etharaResidencies@hotmail.com
to book this great family holiday home.

For more details contact
Shiroma on +9411 286 9518, +9477 220 2100 or
Call Uditha in Australia on +61422 672 484